## කෙටි කතාව

විසිවන සියවසේ මුල් වසරවල ජීවත්වූ ලේඛකයින් අතුරින් ආජන්ටිනාවේ සාහිත්‍යහට විශාල බලපෑමක් රිකාඩෝ ග්‍රාඩස්ගෙන් (1886-1927*) එල්ලවූ බව විචාරක මතයයි. ධනවත් පවුලකින් පැවත ආ රිකාඩෝ, සිට නව යොවුන්විය ගත කළේ, පැරීසියේය. මිය යන විට ඔහු පසුවූයේ හතලිස් එක්වැනි වියේය. එවන් කෙටි ජීවිත කාලයක් තුලවුවද, ඔහු විවිධ සාහිත්‍ය ක්ෂේත්‍රවල සිය අණසක පැතිරවීය. පොලව සමග තිබෙන සම්බන්ධය තුලින් බුද්ධිය මතුවන බව අගවන ආජන්ටියානු ජාතික මානසිකත්වය කදිමට නිරූපනය කළ 1926 පලවූ ඔහුගේ Donsegunde sombra නම් නවකතාව ජාත්‍යන්තර කීරතියට පත් විය. මෙම තෙටි කතාව උපුටා ගන්නා ලද්දේ 1915 දී පලවූ ඔහුගේ බෙහෙවින් සාරථක කෙටිකතා සංග්‍රහයක් වන, Guentos de muertey de sangre නම් බෙහෙවින් සාරථක වූ කෙටිකතා සංග්‍රහයෙනි.



අනුවාදය
ඩබ්ලිව්. එච්. උපසේන
Glen Waverley,



# ගෙත්තම

**බැච්** කියන මහා සංගීතවේදියා ගීත තනුවක් හදනව වගේ- ගෝයා චිත්‍රයක් අඳිනව වගේ- ඩාන්ටේ කවි ලියනව වගේ තමයි, නරනෙස් ගෙත්තම් කළේ. ස්වභාවිකව ප්‍රගුණ කරගත්තු ගෙත්තම් කලාව හින්ද ඔහු හුගක් ප්‍රසිද්ධ වුනා. ඒ විතරක් ඒ කලාව විසින් එයාගෙ ජීවිතේම පවරගෙනයි, තිබුනෙ.

අනෙක් අතට හැම ශ්‍රේෂ්ඨ මිනිහෙකුට වගේ ම නරනෙස්ටත් ඔහුට උරුම බේදාන්තයක් තිබුන. ඔහු එය විඳගනිමින් ගෝලයින් දහස් ගණනකට සිය කලාව උගැන්වුවා. ඒ වුනත් තමන්ට හුගක් කිට්ටුවර අයට පවා, මේ කලාවේ යම් යම් රහස් නම් හෙලි කරන්න ගියේ නැහැ.

මුලදි ඔහු තළ ගෙත්තම් එච්චර හොඳ තත්වයක තිබුනෙ නැහැ. ඉස්සර වෙලාම ඔහු කළේ නිකාසියෝ යටතේ හම් වලින් බොත්තම් සෑදීමයි. හම් පටි වතුරෙ පොගවා එහාට මෙහාට නැමිය හැකි තත්වයට පත් කිරීමෙන් පසුවයි, එසේ කළ හැකිවූයේ. ටික කාලයක් යනවිට, ඔහු ගෙත්තම් කලාවෙ බොහෝ දේවල් ඉගෙන ගත්ත. නිකාසෝ වැඩ කරන විදිය නිහඬව බොහෝ වේලාවක් බලා සිටින්න ඔහු පුරුදු වුනා. නමුත් ඔහු ප්‍රශ්න කරන්න කරන්න ගියේ නැහැ. ඔහු විවිධ රටාවලට අයිති සංකීරණ මෝස්තර. ඒවා ගොතන විදිය කෙනෙකුට කියල දෙන්න අමාරුයි.

මේ විදියට ගෙත්තම් කලාව පලල්ව හදාරල එහි තාක්ෂණය හොඳින් ප්‍රගුණ කළාට පස්සෙ තමයි, තමන්ගෙ සිහිනය සැබෑ කර ගන්න පදනමක් වැටුනෙ. ඊට පස්සෙ ඔහු තළේ තමන්ගෙ කුටියෙ දොර වසාගෙන තමා උගත් ශිල්පය තුලින් විවිධ අත්හදා බැලීම් කිරීමයි. ඒ තුලින් හම් පටි වලින් කදිම ලෙස බොත්තම් නිමා කරන්න ඔහු හැකියාව ලබා ගත්ත.

ඒක නම් නරනෙස්ටම ආවේනික වූ ගෙත්තම් කලාවක්. හරිම සංකීරණ විදියට- හරිම සියුම් විදියට ඔහු තමන්ගෙ රටාවන් නිරමාණය කළේ. මෙතෙක් කල් ගෙත්තම් කරපු සම්ප්‍රදායික චිත්‍ර ආදිය වෙනුවට, සොබා දහමේ ගහ කොල හා සතුන්ව ගෙත්තම් කරන්නයි, ඔහු පටන් ගත්තෙ. වෙනස් වෙනස් අංගත් වරින් වර එකතු කළා.

නරනෙස් තම කලාව දියුණු කළේ ඉතා සෙමින්. කරුණු කීපයක් නිසයි, එතත් නම්, අවශ්‍ය විදියට හම් තීරු සකස් කර ගැනීම සඳහා කාලයක් ගතවීමයි. ඒවා හරියටම අශ්වයින්ගේ කෙස් මෙන් අනගි විය යුතුවුනා. අනෙක, විවේක කාලය මඳවීමයි. අනම් මනම් කථා කියමින් සෙස්සන් උපහාසයට ලක් කරමින් කාලය නිකරුණේ කා දමන මිතුරන් මගහැරීමට සිදුවීමත් මෙයට තදින්ම බලපෑවා.

ඉතින් මේ විදියට නරනෙස් තමන්ගේ කාමරය වසා කරන්නේ කුමක්ද? යන ප්‍රශ්නය සෙසු කම්කරුවන් අතර කුතුහලය වඩවන කාරණයක් සේ දුරදිග ගියා. අන්තිමට එය ආයතනයේ ප්‍රධානියටත් සැලවුනා. හදිසියේම ඔහු නරනෙස්ගේ කුටියට කඩා වැදුනා. නරනෙස් කොයිතරම් අවධානයකින් වැඩේ නිරත වෙලා හිටියද කිව්වොත්, හම් පටි හැම තැනම විසිරිල තිබුන ඒව අයින් කරන්න වත් වේලාවක් තිබුනෙ නැහැ.

විවේක කාලය හමාරවූ වහාම නරනෙස්ව තම අභිමුවට කැඳවූ ප්‍රධානියා මියගිය ගෙත්තම් කරුවකු විසින් නිමවන ලද බොත්තම් සහිත අගනා නිරමානයක් පෙන්වා ඒ අන්දමට එකක් නිමවන මෙන් ඔහු ගෙන් ඉල්ලා සිටියා. පසුවදා වන කොට මෝස්තරය නිමවා හමාර වුනා. දෙක සංසන්දනය කොට බැලූවිට පෙනුනේ, මියගිය මෝස්තර කරුවාගේ නිරමාණය හුදු බාල ගණයේ කමකට නැති එකක් ලෙසටයි. මේ වැඩෙන් පස්සෙ, නරනෙස්ගෙ නිරමාන කෞශල්‍යය පිලිබඳ ආරංචිය ලැව් ගින්නක් මෙන් දස අතේම පැතිරෙන්න පටන් ගත්ත.

තමන්ට ලැබුනු ඇනවුම් වැඩිවීමත් සමග නරනෙස්ට කරගෙන ආ රස්සාවෙන් අස්වී වෙනමම වැඩ කරන්නට සිද්ධවුනා. දවස පුරාම ඔහුට ඇනවුම් ගලාගෙන ආව. මේ වෙනස ගැන ප්‍රීතිමක් වෙන්න තරම් වත් ඉස්පාසුවක් ඔහුට හම්බවුනේ නැහැ. ඇනවුම් වැඩිවීම නිසා ගැනුම් කරුවන්ට හොඳ සේ-වයක් කරන්න හිතූ ඔහු ගම අතහැර නගරයට ආව.

වෙනත් කිසිම මෝස්තර කාරයෙකුට

**මේ මෝස්තර දැක්ක ඔහු කැලඹුනා. නැවත ගෙත්තම් කරන්න අතවත් තියන්නෙ නැහැ කියල කිව්ව නරනෙස් මීට අවුරුදු පනහකට විතර කලින් පටන් ගත්තු අතර මග නතර කළ දිරා ගිය ගෙත්තම් කැබැල්ල තදින් වැළඳ ගත්ත.**

මෙහෙම කීරතියක් අත්වෙලා තිබුනෙ නැහැ. මිනිස්සු අතර පැතිර ගිය ආරංචියක් තමයි, ඇන්ඩීස් කඳුතරයෙ ඉන්න විකුනා කියන සතාගේ හමෙන් හරියට රෙද්දක් වගේ නමන්න පුථවන් කබායක් ඔහු තමන්ට සකස් කරගෙන තිබෙන බව. ඔහු ඒ හමෙන්ම බොත්තම් කපා ගෙන බොත්තම් කාසි වල සිදුරු පවා නොපෙනන විදියට ගෙත්තම් කර ගත්ත කියලයි, ඇතැම් අය කියන්න ගත්තෙ. කාලයකට පස්සෙ ඔහු නගරයෙ අශ්වයින්ට කස තනන්නා හැටියටත් පත් කළා.

හම් ඔප දමන්න පාවිච්චි කළ ගලක් එක්කම ඔහු තමුන්ගෙ අතත් පාවිච්චි කළා. ඔහු පාවිච්චි කරපු පිහිය මැනවින් ක්‍රියාත්මක කළහැකි ඇඟිලිවල දිගුවක් වගේ කියල තමයි මිනිස්සු කියන්න ගත්තෙ. තරමක් පලල හම් පටියකින් සියුම් හම් නූල් ඉරා ගන්න කොට ඒවා අත්ලත් පිහියත් අතර ගොඩ ගැහුනේ ගංගාවක වතුර පිරෙනවා වගේ රැලි ඇති කරමිනුයි.

විවිධ මිනුම් වල හා ප්‍රමානවල හම්පටි සිදුරු සාදන උල් ඔහුගේ ඇඟිලි කටුවල රඳවා ගෙන තිබුනෙ හරියට ඒව ඔහු උපදින කොටත් පිහිටල තිබුන ඒව විදියට පෙනෙනව වගේ.

නරනෙස් හම් පටි පෙගෙව්වෙ තමන්ගෙ තොල් අතර පාවෙන තත්වයට ගේන්න. ඊට පස්සෙ, ඔහු ඒව පිහි තලයෙ පිට පැත්ත දිගේ තදින් යවන්නෙ ඒව හොඳටම නැමෙන සුළු ඒවා බවට පත් කරන්නයි.

ඒවගේම ඔහුට හිටිය අපූරු වෙළඹක්. හැම වසරකම ඌ කළු පාට හමක් සහ ලා පාට හමක් තියෙන පැටියන් දෙදෙනෙකු බිහි කරනවා. මාස තුනක් වයස යන කොට මොවුන් දෙදෙනාම මරා ලබා ගන්නා හම් වේලා ඒ හම් දෙවරගයම එකට මුසු කරමි-න් අගනා මෝස්තර ගොතන්නේ වෙනත් කිසිවකුටත් ඒ වික්‍රමය කරන්න බැරි වෙන සුවිශේෂ අන්දමටයි.

වසර හතලිහක් මුළුල්ලේම සිය ගනුදෙනු කරුවන් තෘප්තිමත් කරමින් තම කෞශල්‍යය තව තවත් ඔප නංවා ගනිමින් නරනෙස් මහා මුදල් සම්භාරයක්ද ඉපයුවා. ධනවත්තු ඔහුගෙ අවධානය දිනා ගන්න විශාල වශයෙන් තෑගි බෝගත් දුන්න. එහෙත් ඒවගෙ වෙලාවලට ඔහුගෙ මුහුනෙ රැඳුනෙ දැඩි පරිස්සම්කාරී විමසිලි ගතියක්.

ඉතින් ඔහුත් ක්‍රමයෙන් මහළු වුනා. ගෙත්තම් කලාවෙ දිනකට පැය හතරකට වැඩිය යෙදෙන්න හැකියාට නැතිවුනා. ඊට වැඩිය වැඩ කරන හැම විටම ඔහු අධික විදියට වෙහෙසට පත්වෙනව විතරක් නෙවෙයි, ගොතන මෝස්තර වල සමබරතාවයත් නැතිවෙලා ඒව නිකම් ගොඩැලි වෙලා යන්න පටන් ගත්ත. මෙන්න මේ කාලෙදි තමයි, ඔහු තමන්ගෙ වෘත්තිය අත් ඇරල දැම්මෙ. අසරණව දුරවලව දිරාපත් කයක් හිමි කරගත් නරනෙස් තම ජීවිතය හැල හොල්මනත් නැතිව ගෙවා දමන්න අන්තිමට අවසරය ලැබුව.

ඉන්පස්සෙ එක් වරක් හෝ හම් තීරු පටියක් අල්ලන්න කිසිම ආශාවක් ඔහුට ඇතිවුනේ නැහැ. ඒ පිළිබඳ කෙරෙන කථා බහ වලට හවුල් වීමකට පවා නරනෙස් කැමැත්තක් දැක්වූයේ නැහැ. ක්‍රමයෙන් ඔහු ළමා කාලයේ මෙන් හැසිරෙන්න පටන් ගත්ත. මේ රෝගය යටපත් වුනේ දවසක් ඔහු තමන්ගෙ පරණ ඇඳුම් පෙට්ටියක් අවුස්සන විටදී හම්බවේච්ච තරුණ කාලෙ පටන් ගෙන ඉවර කරන්න බැරිවෙච්ච මෝස්තරයක් හම්බවුනාමයි.

මේ මෝස්තර දැක්ක ඔහු කැලඹුනා. නැවත ගෙත්තම් කරන්න අතවත් තියන්නෙ නැහැ කියල කිව්ව නරනෙස් මීට අවුරුදු පනහකට විතර කලින් පටන් ගත්තු අතර මග නතර කළ දිරා ගිය ගෙත්තම් කැබැල්ල තදින් වැළඳ ගත්ත. ඊට පස්සෙ නොකඩවා වැඩ කරමින් එය නිමා කරන්න පුදුම වෙහෙසක් ගත්ත. එම වෙහෙස ඔහුගේ දුබල නෙත් වලට හා ගතට ඔරොත්තු දුන්නේ නැහැ. අනිත් අතට එක තැන වාඩි වෙලා බොහො 'වේලාවක් හිඳීමෙන් ඔහුගේ ශාරීරික වේදනා වැඩිවුනා. බිමට ඔළුව හා කඳ නමාගෙන බොහෝ වේලාවක් ගොතන මෝස්තර දැඩි අවධානවයක් යෙදවීම ඔහුට ඇති කළේ මාරාන්තික බලපෑමක්. එයින්ම ඩොන් ක්‍රිසාන්ටෝ නරනෙස් මරණයට පත්වුනා.

වකුටුවී ගල්වී තිබුනු ඔහුගේ සිරුරින් ගෙත්තම ඉවත් කර ගන්න අපහසු වුනා. එය කටු බේරී තිබුනු දෑත්වල නිය වලට තද කරගෙන පපුවට හේත්තු කරගෙන තමයි, ඔහු මිය ගිහින් තිබුනෙ.

මිතුරන්, පවුලේ උදවිය සහ ඔහුට ගරු බුහුමන් දක්වන්නන් මෙලෙස නිමාවක් නොදුටු මේ ගෙත්තම් මේ අන්දමට තුරුඹ කරගෙනම නරනෙස් මිය යැම ගැන බො-හොම දුකින් කථා කළා. සමහරු කීවේ, එය ඔහුගෙ හොඳම නිරමානය කියලයි. ඒ නිසා මහඹ මිනිසාගේ ඇඟිල්ල කපා හෝ මෙම අනගි නිරමානය ඉවත් කරගෙන මිස මිනිය වලලන්න එපා කියල එක් අයෙක් යෝජනා කළා. එහෙත් එවිට අනිත් කට්ටිය ඔහු දිහා එකපාරටම රවල බැලුව.
,මොනව....නරනෙස්ගෙ ඇඟිලි කපන්න.....? නරනෙස්ගෙ මේ දිව්‍යමය ඇඟිලි......?,,

අමුතු හා කිසියම් අපැහැදිලි යමක් කියාපා-න්න වගේ නෙත් වලින් කරන බැල්මක් ඇතුවයි, මේ මෝස්තර පපුවට තද කරගෙන ඔහු මිය ගිහින් තිබුනෙ. එය ඇත්තටම ඔහුගෙ පළමු හා අවසාන නිරමානය වුනා. ඉතින් එතරම් හොඳ තත්තයේ නැති නිරමාණයක් මෙලොවට ඉතිරි කර නොයෑමට ගත් තැතක් ද ඒ ඉරියව්වෙන් කියැවුනේ? එහෙමත් නැත්නම් තමා එම නිරමාණයට හුගක් ප්‍රිය කළ බව හගවන බැල්මක්ද එහි රැඳුනේ? එහෙමත් නැත්නම් සරලව කලා කරුවා තමන්ගේ හොඳම නිරමානය සමගම මිහිදන් වන්නට පළකළ ආසාවද?

■